# ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

# පුරප්පාඩු දැන්වීමයි

**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව අඩු ආදයම්ලාභීන් සඳහා නීති ආධාර ලබාදීම මූලික කරගනිමින් 1978 අංක 27 දරණ නීති ආධාර පනත මගින් සංස්ථාපනය කර ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි.**

## තනතුර - සහකාර අධ්‍යක්ෂ /නියෝජ්‍ය අධ්‍යක්ෂ (මූල්‍ය)

**(පුරප්පාඩු - ප්‍රධාන කාර්යාලය - 01 යි**

**සුදුසුකම්**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මූල්‍ය හෝ ගණකාධිකරණය හෝ කළමණාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම සමග උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ඒ හා සමාන පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක පළපුරුද්දක් ලබා තිබීම.
- පිළිගත් වරළත් වෘත්තීය ආයතනයක (ICASL,CIMA,ACCA,CMA) අන්තර් මධ්‍යම මට්ටමේ පරීක්ෂණය සමත්වීම සමග රජයේ, රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ ඒ හා සමාන පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ මුදල් පිළිබඳව කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක පළපුරුද්දක් ලබා තිබීම.
- 2024.01.01 දිනට වයස අවුරුදු 32 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය.
- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**රැකියාවේ වගකීම**

නීති ආධාර කොමිෂන් සභාවේ මූල්‍ය අංශයේ සියලුම රාජකාරී කටයුතු පරිපාලනය හා අධීක්ෂණය කිරීම

**වැටුප් කේතය**

MM -1-3- රු.55,925 -10x 1,375-15 x 1,910 – 98,325 + කළමනාකරන සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති රජයේ දීමනා සහිතයි. +EPF/ETF

## තනතුර -නීති නිලධාරී (පුරප්පාඩු -09යි)

**උතුරු පළාත - 03 /දකුණු පළාත - 01 / නැගෙනහිර පළාත - 02/ඌව පළාත - 01 /වයඹ පළාත - 02**

**සුදුසුකම්**

- ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දීමෙන් පසු වසර තුන(03)ක ක්‍රියාකාරී වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම
- 2024.01.01 දිනට වයස අවුරුදු 28 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය.
- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**රැකියාවේ වගකීම**

නීති ආධාර කොමිෂන් සභාවේ නීතිඥයෙකු වශයෙන් අධිකරණයේ කටයුතු කිරීම හා කොමිෂන් සභාව විසින් නීති නිලධාරියෙකු වශයෙන් පවරා දෙනු ලබන සියලු රාජකාරී ඉටු කිරීම.

**වැටුප් කේතය**

MM -1-1- රු.53,175 -10X 1,375-15 X 1,910 – 95,575 + කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති රජයේ දීමනා සහිතයි. +EPF/ETF

## තනතුර - කළමනාකරණ සහකාර (තාක්ෂණික) (පුරප්පාඩු - 01 යි)

**ප්‍රධාන කාර්යාලය - 01**

**සුදුසුකම්**

- තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද පරිගණක ක්ෂේත්‍රයෙහි ජාතික වෘත්තීය කුසලතා පස් (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.
- 2024.01.01 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය.
- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**රැකියාවේ වගකීම**

නීති ආධාර කොමිෂන් සභාවේ බඳවා ගැනීමේ පටිපාටියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික) තනතුරට අදාළ සියලු රාජකාරීන්

**වැටුප් කේතය**

MA -2-2- රු.30,310 -10X 300-7 X 350– 4x600-20x 710 - 52,360 + කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති රජයේ දීමනා සහිතයි) +EPF/ETF

සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

(ඉහත සියලු තනතුරු සඳහා බඳවා ගැනීමෙන් පසු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා අදාළ කාලයන්හිදී පෙනී සිටිය යුතු වේ)

ඉහත තනතුරු සඳහා අයදුම්පත් 2024 මාර්තු 14 දිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් යොමු කරන්න. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ විසින් අයදුම් කරනු ලබන තනතුර හා ස්ථානය සඳහන් කිරීම අනිවාර්යය වේ.)

**ලිපිනය**
**සභාපති,**
**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව,**
**මහාධිකරණ සංකීර්ණය, අළුත්කඩේ, කොළඹ 12.**